## 13 – කොඩිවැල් නංවා

කොඩිවැල් නංවා – මල් දම් රන්දා – ඔබ මග සරසාලා
රන් දද බඳවා – රන් පටි ලෙලවා – මංගල සිරි මවලා

පැතුම් ගොඩක් පිරිලා – යැදුම් ගොඩක් යැදලා //
සමිඳු පුදන්නට දෙවිඳු යදින්නට – පුදසුන වෙත ඇදිලා //

වීනා වයලා – රබන් ගසාලා - තුති බැති ගී ගයලා
නැටුම් නටාලා - ගැයුම් ගයාලා – මංගල සිරි මවලා

පහන් දල්වලා – හඳුන් සුවඳලා – පුදසුන ඔප කරලා
මලින් සරසලා – පාවඩ එලලා – මංගල සිරි මවලා

සතුට ඇවිල්ලා - දුක පහවීලා – සිනහාව මුව රැඳිලා
බේද දුරුරලා – එක්සත් වීලා – මංගල සිරි මවලා

දෙගුරුන් කැන්දා – සොයුරන් කැන්දා – එක පවුලක් වීලා
සැම දෙන කැන්දා – එකමුතු වීලා – මංගල සිරි මවලා